**ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2019 වාර්තාව**
**------------------------------------------------------------**

# 1 මූල්‍ය ප්‍රකාශන

**----------------**

## 1.1 මතය

**------**

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛය | | | |
| (i) 5.1.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් සමාගම විසින් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | **එකඟ වේ.**<br><br>ඉදිරියේදී ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම පිළිබඳව කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිත, සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ii) 8.2.2 වගන්තිය | රජය සතු සමාගමක් විසින් කෙටිකාලීන තැම්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැම්පතු හෝ වෙනත් මූල්‍ය ආයෝජනයන් සිදු කරන්නේ නම් මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය (Concurrence) ලබාගත යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු. 250,550,020 ක් ආයෝජන සඳහා එම එකගතාවය ලබා ගෙන නොතිබුණි. | **එකඟ වේ.**<br><br>ආයතනය විසින් මුදල් ආයෝජනය කර ඇත්තේ ස්ථාවර තැන්පතු වල පමණක් වන අතර, ඉදිරියේදී කරනු ලබන නව ආයෝජන සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය සමාගමක අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී අදාල එකඟතාවය ලබාගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) 8.8 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම එක් එක් වර්ෂයක් ආරම්භයේදීම වියදම් සීමා දක්වමින් බලය බෙදීම **(**Delegation of Authority) පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සමාගම ඉහත අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී බලය බෙදීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | වර්ෂය තුළ සමාගමේ කටයුතු කරගෙන යාමේදී බලතල ක්‍රියාත්මක කිරීමේ සීමාවන් චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුදැනුම සහිතව නිශ්චය කිරීම අවශ්‍ය වේ. |
| (iv) 9.2 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල යුතු වුවත් සමාගම ඉහත අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | **එකඟ වේ.** ඉදිරියේදී මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය පරිදි මානව සම්පත් පිළිබඳ මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට කළමනාකරණය කටයුතු කළයුතු වේ. |
| (**v**) 9.3.1 වගන්තිය | සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණි. | **එකඟ වේ.** ඉදිරියේදී මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | විධිමත් හා විනිවිධභාවයකින් යුතුව මානව සම්පත් කළමනාකරණය කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඡේදයේ දක්වා ඇති පරිදි අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. |
| (ආ)2017 අගෝස්තු 14 දිනැතිඅංක එන්පී/එස්පී/එස්ඩීජී/**17** දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය | තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගැනීම සිදු කර නොතිබුණි. | **එකඟ වේ.** ඉදිරියේදී මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. | තිරසාර සංවර්ධන අරමුණු, හඳුනාගෙන ඒ අනුව ඉලක්ක පිහිටුවා, එම ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

## **2.** මූල්‍ය සමාලෝචනය

**----------------------**

### **2.1** මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 92,885,648 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 91,294,628 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,591,020 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)ගොඩනැගිලි සැලැස්මක් සකස් කිරීම වෙනුවෙන් වර්ෂ 4 කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු වූ රු. 5,779,760 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. තවද එම මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගෙවිය යුතු ශේෂයක් ලෙස ඇතුලත් කර නොතිබූ අතර එම මුදල අය කර ගැනීම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.කෙසේ වුවද සමාගම විසින් මේ සඳහා හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි. | එකඟ වේ.<br>2018වසරේ දී නිකුත් කල විගණන විමසුමට අනුව සමාගමේ සභාපතිවරයා විසින් මෙම රු 5,779,760.ක මුදල පියවන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා ,වෙත ලිපියක් යොමු කරන ලදී .අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ විසින් 2018.11.19 වන දින එම ලිපිය සඳහා එවන ලද පිළිතුර අනුව ,මෙම මුදල නොගෙවන බව දන්වා ඇත .මේ අනුව මෙම වියදම ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන මුදල් අමාත්‍යාංශයෙහි අනුමැතිය ද සහිතව බොල් ණය ලෙස කපා දැමීමට කටයුතු කරනු ඇත . | සාධාරණ හේතු ඉදිරිපත් කරමින් මේ පිළිබඳ වරාය අධිකාරිය සමඟ සාකච්ඡා කර අවසන් නිගමනයකට පැමිණීම අවශ්‍ය වේ. |
| (ආ)2019 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව තිබූ පාරිභෝජ්‍ය තොග වටිනාකම රු.මිලියන 1.73 ක් වූ අතර ඉන් රුපියල් මිලියන 1.2 ක වටිනාකමින් යුත් අයිතම 282 ක් දීර්ඝ කාලීනව නිකුත් නොවී පැවතුණි. එසේම ඉහත තොගය තුළ අන්තර්ගත භාවිතයට ගත නොහැකි අයිතම හඳුනාගෙන තොග හානිකරණ සඳහා වෙන් කිරීමක්ද සිදු කර නොතිබුණි. | එකඟ වේ.<br>ආයතනය විසින් මේ සඳහා තාක්ෂණික දැනුමක් ඇති නිළධාරියෙකු යොදවා දීර්ඝ කාලීනව නිකුත් නොවී පැවතුන අයිතම ඉදිරියේදී හඳුනාගෙන තොග හානිතරණය සඳහා වෙන් කිරීමට පියවර ගනු ඇත. | විධිමත් තොග පාලන ක්‍රම වේද හඳුන්වාදීම තුලින් යාවත්කාලීන තොග පවත්වාගෙන යාම කළමණාකරණයේ වගකීම වේ. |
| (ඇ)සමාගමේ තෙල් ටැංකි කුලී පදනම මත භාවිතා කරන නාවික තෙල් බලපත්‍ර ලාභීන් අටදෙනෙකු සමග අත්සන් කරන ලද ගිවිසුම්වල වලංගු කාලය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබූ නමුත් 2020 වර්ෂය සඳහා එම ගිවිසුම් අලුත් කිරීම 2020 පෙබරවාරි 25 දින තෙක් සිදු කර නොතිබුණි. මේ හේතුවෙන් නීතිමය ගැටළු ඇතිවීමේ අවධානම විගණනයේදී බැහැර කල නොහැකි | සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලය 2019 දෙසැම්බර් 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. තවද. එහිදී දැනට පවත්නා ගිවිසුම සම්බන්ධව නිසි අධ්‍යනයක් කිරීමට හා පාවෙන තෙල් ගබඩා සංකීර්ණය පවත්වාගෙන යාම / රසායනාගාර පහසුකම් සැලසීම ආදී නව කරුණු සම්බන්ධව සළකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ගිවිසුම් සම්පූර්ණව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම තුලින් නීතිමය ගැටළු ඇතිවීමේ අවධානම අවම කරගත හැකි වේ. |

| | | |
|---|---|---|
| විය. | නීතිඥ මහතුන් දෙදෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කරන ලදී. එකී කමිටු නිර්දේශය ලැබෙන තෙක් පවත්නා ගිවිසුම එම කොන්දේසි මත මාස 02 කාලයක් දක්වා (2020/02/29) දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණ.<br><br>එකී කමිටු නිර්දේශය 2020/01/09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර ආවරණය වී නොතිබූ කරුණු අඩංගු කොට නව නීතිමය ප්‍රතිපාදන ඇතුළත් ගිවිසුමක් කෙටුම්පත් කිරීම සඳහා නීතිඥ සහය ලබා ගැනීමට තීරණය විය.එකී නව ගිවිසුමට 2020/02/28 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණ. | |
| (ඇ)සමාගමේ තෙල් ටැංකි 9 ක් සම්බන්ධයෙන් වන ගිනි හානි අවම කිරීම සඳහා රු. මිලියන 90 ක පිරිවැයක් මත ආරක්‍ෂක පද්ධතියක් (Installation of fire form pouring system) සවි කිරීම සඳහා වූ ප්‍රසම්පාදනයක් 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබුණි. මේ සඳහා ටෙන්ඩර් කැඳවීමට අංක 05/19 හා 2019 ජුනි 20 දිනැති අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එය ක්‍රියාවට නංවා නොතිබුණි. | සමාගමේ නව අධ්‍යක්ෂ මණ්ඩලය 2019 දෙසැම්බර් 23 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුම අත්සන් කිරීම සඳහා 2020/05/29 වන දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ඉන් පසුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට අදාළ කඩිනම් පියවර ගනු ඇත. | ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව ඉටු කර ගැනීම කළමනාකරණයේ වගකීම වේ. |
| (ඉ)මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු මුදල් ශේෂය රු.11,519,327 ලෙස දක්වා තිබූ අතර එදිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගම වෙත ලබා දී තිබූ ශේෂ සනාථන ලිපිය අනුව අධිකාරිය සමාගමට ගෙවිය යුතු මුදල රු.10,198,415 ක් ලෙස දක්වා තිබුණි. මේ අනුව අයකරගත යුතු ශේෂයේ රු.1,320,912 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකග වේ.<br>මෙම වෙනසට හේතු වන්නේ ආයතන තුනක් වෙත නිකුත් කරන ලද ඉන්වොයිස් තුනක වටිනාකම වූ රු.1,320,912 ක් එම ආයතන විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ගෙවා නොතිබීමය. එම මුදල් අදාළ ආයතනවලින් අයකර ගැනීම වෙනුවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය අප ආයතනය වෙත ගෙවන කළමනාකරණ ගාස්තුවලින් එම මුදල් කපා හැර ඇත. | සමාගමට ලැබිය යුතු මුදල් ශේෂය පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ සාකච්ඡා කර අවසන් එකඟතාවයකට පැමිණීමෙන් පසු මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් කිරීම මගින් මෙම වෙනස්කම් අවම කරගත හැකිවේ. |
| (ඊ)2013 වර්ෂයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට සනීපාරක්‍ෂක පහසුකම් සැපයීම වෙනුවෙන් සමාගමට ලැබිය යුතු රු.712,290 ක මුදල සේවා සපයා වර්ෂ 6 ක් ගත වී තිබුණද 2019 දෙසැම්බර් 31 දින දක්වා අයකරගෙන නොතිබුණු අතර හානිකරණය සඳහා වෙන් කිරීමක්ද සිදු කර නොතිබුණි. එසේම මෙම | එකග වේ.<br>මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ Pilot Station සහ මෙහෙයුම් අංශය යන අංශ දෙක වෙනුවෙන් අප ආයතනය විසින් පිරිසිදු කිරීමේ සේවාවන් සැපයීම වෙනුවෙන් 2014 ඔක්තෝබර් සහ 2015 දෙසැම්බර් මස නිකුත් කරන ලද | තොරතුරු සොයා බලා (ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මුදල් ගෙවීමේ විස්තර ආදී) සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් ශේෂ සනාථන ලබාගෙන නොතිබුණි. | ඉන්වොයිස් දෙකකි . ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් අප ආයතනය වෙත මුදල් ගෙවා ඇති බවට මේ පිළිබඳ විමසීම් කළ සෑම අවස්ථාවකදීම දන්වන ලද අතර මෙම ඉන්වොයිස් දෙක සඳහා මුදල් ලැබී නොමැත. ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය සහිතව හානිකරණය සඳහා වෙන් කිරීමක් සිදු කිරීමට කටයුතු කරනු ඇත. | |
| (උ)සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ලෙස රු.1,832,607 ක් දක්වා තිබුණි. එම රඳවා ගැනීමේ බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පියවා ගැනීම සඳහා රඳවා ගැනීමේ බදු සහතිකපත් ඉදිරිපත් කල යුතු වුවද සමාගම සතුව එම සහතිකපත් නොපැවතීම හේතුවෙන් ඉහත මුදල පියවා ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | එකග වේ.<br>ස්ථාවර තැන්පතු සඳහා ගිණුම් තැබීමේදී ආයතනය විසින් උපචිත පදනම මත පොළී ආදායම සහ රඳවා ගැනීමේදී බදු සෑම වසරකම දෙසැම්බර් 31 වන දින තෙක් ගිණුම් ගත කරනු ලබයි. නමුත් බැංකුව විසින් රඳවා ගැනීමේ බදු සඳහා සහතිකපත් නිකුත් කරනුයේ අදාල කල් පිරීමේ දිනය තෙක් පමණි. ආදායම් බදු ගෙවීමේදී අඩු කර ගනු ලබන්නේ සහතිකපත් වල පවතින ප්‍රමාණය බැවින් සෑම වසරකම රඳවා ගැනීමේ බදු ගිණුමේ කිසියම් මුදලක් ඉතිරිවන අතර එය ඉදිරියට ගෙන යනු ලබයි. | බදු බැර ලබා ගැනීමට අපේක්ෂිත රඳවා ගැනීමේ බදු වෙනුවෙන් අදාල සහතික රඳවා තබා ගැනීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම සතු තෙල් ටැංකි 13 හි තෙල් නිමානය කිරීම සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිතා නොකිරීම නිසා මිනුම් ගැනීමේ දෝෂ හේතුවෙන් ඉතිරි වූ තෙල් තොග මෙට්‍රික් ටොන් 546 ක් ශ්‍රී ලංකා රේගුව විසින් වර්ෂය තුළදී රාජසන්තක කර තිබුණි. තවද, මෙසේ ඉතිරිවන තෙල් තොග වාර්ෂිකව ශ්‍රී ලංකා රේගුව මගින් රාජසන්තක කර නැවත විකුණන තෙක් කාලය සඳහා එම තෙල් තොග ගබඩා කර තැබීම වෙනුවෙන් ගබඩා ගාස්තු අය කිරීමක් සිදු නොවන බවද නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් නිවැරදි මිණුම් කටයුතු සිදු කිරීම සඳහා Mass flow meters සවි කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. එකතු වන තෙල් තොග රාජසන්තක කරන කාලය සහ ඒවා ගණනය කිරීම ශ්‍රී ලංකා රේගුව මඟින් සිදු කරන බැවින් ඒ සඳහා අප ආයතනයට ඍජුව මැදිහත් වීමට නොහැක. | තෙල් ප්‍රමාණනය සඳහා තාක්‍ෂණික වශයෙන් දියුණු ක්‍රම භාවිතා කිරීම කළමනාකරණයේ වගකීම වේ. |

| | | |
|---|---|---|
| (ආ)රු. මිලියන 125 ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත මෙට්‍රික් ටොන් 3200 ක ධාරිතාවයෙන් යුතු නව පෙට්‍රල් ටැංකියක් ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 50 ක් ශ්‍රී ලංකා වරාය අධිකරිය වෙත නිදහස් කිරීම සඳහා අංක 05/19 හා 2019 ජූනි 20 දිනැති අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මුදල් නිදහස් කිරීම හෝ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සිදුකර නොතිබුණි. | 2019 අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය 2020 ජනවාරි පත් වූ නව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැඩිදුරටත් විශ්ලේෂණය කර ඇත. තව ද වරාය අධිකාරිය විසින් ඉල්ලා සිටින ලද බැංකු ඇපකරය නොමැතිව අදාල ගෙවීම් සිදු කිරීමට වරාය අධිකාරිය එකගතවීම නිසා මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුම අත්සන් කිරීම සඳහා 2020/05/29 වන දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා ගැනීමට නියමිතය. ඉන් පසුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට අදාළ කඩිනම් පියවර ගනු ඇත. | ගැටළු නිරානරණය කර ගෙන සැලසුම්ගත පරිදි ඉදිකිරීම සිදුකිරීමට කටයුතු කළ යුතුවේ.. |
| (ඇ)380 (HSFO) තෙල් වර්ගයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය ට අයත් මෙට්‍රික් ටොන් 72 ක් ද ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් මෙට්‍රික් ටොන් 75 ක් ද ටැංකි අංක 117 හි පැවති අතර එම තෙල් තොග දීර්ඝ කාලීනව ඉහත ටැංකියෙහි ගබඩා කර තිබූ නමුත් අදාල ආයතනවලින් ගබඩා ගාස්තු (Tank Storage Charges) අය කර නොතිබුණි. | එකග නොවේ.<br>ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයිති තෙල් තොගය සඳහා අයකරණ ලද ගාස්තු ගෙවන ලෙස අප විසින් දිගින් දිගටම ලිඛිතව සිහි කැඳවීම් යවා ඇත. තවද එම ආයතන 2 සමග ඇති ගිවිසුම්ද අවලංගු වී ඇති බැවින් ඉන්වොයිස් නිකුත් කිරීමේ හැකියාවක් නොපවති. | ගබඩා ගාස්තු නිසිවේලාවට අයකර ගැනීම සඳහා අවශ්‍ය පද්ධති හඳුන්වා දීමට කළමණාකරණය කටයුතු කළ යුතු වේ. |